(2)

1123

09 10 11 12 13 14 15 16 17 18 19 20 21 01 02 03 04 05 06 07 08
14 NOV 2018
වාරිමාර්ග කළමනාකරණ අංශය

මගේ අංක :- 030/3/7
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
රිදීබැඳි ඇල ව්‍යාපාරය
මිල්ලගොඩ
නිකවැරටිය.
2018.10.

# වගා රැස්වීම් තීරණ දැනුම් දීම- 2018/19 මහ කන්නය
# රිදීබැඳි ඇල මහා වාරිමාර්ග ව්‍යාපාරය

"1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන අනුව 2018.10.09 දින නිකවැරටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේදී පැවති රිදීබැදිඇල මහා වාරිමාර්ග බල ප්‍රදේශයේ 2018/19 මහ කන්නය සඳහා වගා රැස්වීමේදී එළඹෙන ලද තීරණ මේ සමග ප්‍රකාශයට පත් කරමි.

2018/19 මහ කන්නයේ වගා කාල සටහන තීන්දු තීරණ

| අනු අංකය | කාරණය | තීරණ / දින වකවානු |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය | මාස 3. 3 1/2 |
| 02 | වගා කිරීමට යොජිත බිම් ප්‍රමාණය | 6000 |
| 03 | වගා කිරීමට යෝජිත ප්‍රදේශ | සම්පූර්ණ ව්‍යාපාර බල ප්‍රදේශය |
| 04 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2018 ඔක්තෝම්බර් 15 |
| 05 | මුර ජලය ආරම්භ කරන දිනය | 2018 නොවැම්බර් 13 |
| 06 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2019 පෙබරවාරි 10 |
| 07 | බිම් සැකසීම,වැපිරීම අවසන් කලයුතු දිනය | 2018 නොවැම්බර් 10 |
| 08 | ගොවි සංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇල සහ බෙදුම් ඇලවල්, කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කලයුතු දිනය:- | 2018 ඔක්තෝම්බර් 10 |
| 09 | වගා රක්ෂණය කර අවසන් කල යුතු දිනය | 2018 නොවැම්බර් 10 |
| 10 | වගා හානි දැනුම් දිය යුතු අවසන්දිනය | 2019 පෙබරවාරි 10 |
| 11 | අස්වනු නෙලා අවසන් කල යුතුදිනය | 2019 මාර්තු 02 |
| 12 | 2019 යල කන්නය සඳහා කෙතට පිදුරු යෙදීමේ දිනය | 2019 මාර්තු 12 |

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග ආඥා පනත 11 උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කළයුතු නීති රීති

- අනවසරයෙන් ජලය ලබාගන්නා ඇලවල් වාරිමාර්ග අඥාපණත හා ගොවිජන සංවර්ධන පණතේ විධිවිධාන යටතේ වසා දැමීම කල යුතුය
- ජල ගැලීම් හේතුවෙන් වගාව ස්ථාපිත කිරීමට ප්‍රමාදවන කුඹුරු ඉඩම් සම්බන්ධව තීරණ ගැනීම ව්‍යාපාර කළමනාකරණ කමිටුවකදී කළයුතුය
- ව්‍යාපාර කළමනාකරණ කමිටුවට උක්ත කාලසටහන වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා බලය පැවරේ.
- කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 1 කට රු. 500/= ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
- ව්‍යාපාර කමිටුව විසින් සකස් කරනු ලබන මුර ක්‍රමයට ව්‍යාපාරයෙන් ජලය ලබා ගන්නා සියළු දෙනා අවනත විය යුතු අතර පිවිසුම් ඇල හා ප්‍රධාන ඇලවල් හා අනිකුත් ඇලවල් අනවසරයෙන් හරස් කිරීම සපුරා තහනම්.
- පිදුරු පිලිස්සීම සපුරා තහනම්වේ. පිදුරු පුලුස්සන ගොවීන් සඳහා පොහොර සහනාධාරය හිමි නොවේ. එසේ වුවද ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයා සෑහීමට පත්වන ලෙස කාබණික පොහොර ගොවියා යොදන්නේනම් සහනාධාර පොහොර ලබා දීම සිදුකල හැකිය.

- ගොවි සංවිධාන විසින් පොදු කටයුත්තක් වෙනුවෙන් සූදානම් කර සාමාජිකයින් වෙත දැනුම් දෙනු ලබන ශ්‍රමදාන වැඩ සටහන් සඳහා සහභාගී නොවන සාමාජිකයකුගෙන් රු. 1000/= කමුදලක් ගොවි සංවිධානය වෙත අයකර ගැනීමට ගොවි සංවිධානයට බලය පැවරීම
- කිරිඳිගල්ල ගොවි සංවිධාන බල ප්‍රදේශයේ හා ඕතොට දිවුල්ලෑව ගොවි සංවිධාන බල ප්‍රදේශවල ඇල පද්ධතියක් හෝ කුඹුරු බට නොමැති බැවින් එම ප්‍රදේශවලට ව්‍යාපාර කමිටුවේ සකස් කරන මුර කාල සටහන අනුව බට දමා ජලය ලබා ගැනීමට හැකි අතර අනෙකුත් ගොවි සංවිධාන බල ප්‍රදේශවල පිවිසුම් ඇළ හෝ ප්‍රධාන ඇලවල්වලට හෝ බට දමා ජලය ලබා ගැනීම සපුරා තහනම් වන අතර උක්ත ගොවි සංවිධාන දෙකද තම ගොවි සංවිධානයට හිමි ජල මුර දිනවලදී පමණක් පාලනයක් ඇතිව බටදමා ජලය ලබා ගත යුතුය
- ජලය නිකුත් කිරීම අවසන් යෝජිත දිනයෙන් පසු ජලය ඉල්ලීම වෙනුවෙන් ව්‍යාපාර කළමනාකරණ කමිටුවක තීරණයක් ගත යුතු අතර අමතර ජලය ලබාදීම වෙනුවෙන් මුදලක් නියම කිරීම කල යුතුය. ( අමතර ජලය වෙනුවෙන් ව්‍යාපාර කමිටුව විසින් අක්කර 1 කට අය කරන මුදල තීරණය කල යුතුය )
- ගවයින් මගින් මේ වනවිට සී සෑම හෝ ගොයම් මැඩීම නොකරන බැවින් ගවයින් යායට ඇතුළු කිරීම සපුරා තහනම් වන අතර වගාවට හා වාරිමාර්ග නිර්මිත වලට හානි වන අයුරින් ගවයින් බැඳීම හෝ නිදැල්ලේ යැවීම තහනම් වන අතර වාරිමාර්ග නිර්මිතවලට හෝ යායට ලණු සහිතව හෝ රහිතව ඇතුළු කිරීම සඳහා එක් ගවයකු සඳහා රුපියල් 1000/= ක අවමයකට යටත්ව දඩ මුදලක් ගොවිජන සේවා කමිටුවට අය කර ගැනීම කල යුතුය .
- ඇලවේලි හා කෘෂි මාර්ගවලට හානිවන පරිදි කොළ මැඩීම වෙනුවෙන් රුපියල් 5000/= ක දඩයක් වරද කරන පුද්ගලයාගෙන් අදාල ගොවි සංවිධානය විසින් අය කල යුතුය
- වාරිමාර්ගවලට හානි කර නිර්මිත හරහා කුඹුරු ඉඩම්වලට වාහන ගන්නේනම් තම කාර්යය ඉටුකර ගත් වාහම නිර්මිතය පෙර තිබූ තත්වයට සකස් කල යුතුය. එසේ නොකරන ගොවීන් විසින් ගොවි සංවිධානය වෙත රුපියල් 5000/= ක අවමයකට යටත්ව දඩ මුදලක් අය කල හැකිය
- රක්ෂිත ගල් කණු යොදා රක්ෂිත සීමාවන් වෙන් කර ඇති සියළුම ඇල රක්ෂිත සීමාව තුල වගා කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.

2018/19 මහ කන්නය වෙනුවෙන් කන්න රැස්වීමට ඉදිරිපත් කිරීමට රිදීබැඳි ඇල ව්‍යාපාරයේ උක්ත වගා කාලසටහන සහ රීති මාලාව සුදුසු බවට බුදුමුත්තාව ගොවි සංවිධානයේ ගරු සභාපති ඊ. එම්. ගුණතිලක මහතා යෝජනා කල අතර ඕතොට දිවුල්ලෑව ගොවි සංවිධානයේ ගරු සභාපති එල්. එච්. කපුරුබංඩා මහතා ස්ථිර කර සහා සම්මත කරගන්නා ලදි.

ගාමිණී ඉලංගසිංහ
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්